නොවරදවා රැස්වන්න. ඉර පායන වෙලාව උදේ 6.14 ට. ඒ සඳහා නැරඹුම් වේදිකාවල හොඳ තැනක් අල්ලා ගැනීමට පැය කාලකටවත් කලින් යන්නට ඕනෑ"
මෙම පණිවුඩය, පදනමේ ලේකම් සහ චාරිකාවේ ප්‍රධාන සංවිධායක අජන්තා සොයුරිය විසින්, අපගේ කණ්ඩායමේ අය නවාතැන් ගෙන සිටි, සෑම නිකේතන නිවාසයකටම පෞද්ගලිකව දන්වන ලදී. සියලූ දෙනාම දැන්වූ පරිදි නියමිත තැනට රැස්වී, හිරු උදාව නැරඹීම සඳහා හිමිදිරි පාන්දර පහට පිටත් වීමු.

හිරු උදාව නැරඹීම සඳහා නියමිත ස්ථානයට යාම සඳහා අපට පැයක් පමණ ගතවිය. ඒ වන විටත් සංචාරකයින් විශාල පිරිසක්, පරවතය ඉදිරිපස කඳු ගැටයක, තට්ටු වශයෙන් සකස් කර තිබුණු නැරඹුම් වේදිකා මත රොක්වී සිටියහ. අප සියලූ දෙනාටම පහසුවෙන් නැරඹිය හැකි ස්ථානයක් ලැබිණ.

විවිධ කැමරා මානා ගෙන හිරු උදාව ඡායාරූප ගත කිරීම සඳහා විවිධ රටවල අය සිය ගනණක් නැරඹුම් වේදිකා මතට වී සිටියහ.

පෙරවරු හය පමණ වන විට පෙරදිග අහසේ තරමක දීප්තියක් ඇතිවී එය ක්‍රමක්‍රමයෙන් වැඩිවන අකාරය අපට පහසුවෙන් දැක ගන්නට ලැබිණ.

එම දීප්තිය ක්‍රමක්‍රමයෙන් වැඩිවී පර්වතයට ඉහළින් ක්ෂිතිජය මට්ටමෙන් එක්වරටම ළහිරු රැස් දහරා දසත විහිදුවමින් හිරු උදාවී අරුණැල්ල මගින් වටපිටාව ඒකාලෝක විය ය. මෙය කාටත් සදා අනුස්මරණීය දසුනක් වූ බව නොඅනුමානය.

මෙම දර්ශණය, බොහෝ දුරට, අප කවුරුත් ශ්‍රී ලංකාවේදී සිරිපා කරුණා කරන අවස්ථාවලදී දැක ඇති සිරිපා කඳු මුදුනේ ඉර සේවය වැනි ස්වාභාවික සංසිද්ධියකි. උලූරු ඉර සේවයි නැරඹීමෙන් පසුව අපි තවත් ඉතා වැදගත් යුතුකමක් ඉටු කිරීමට අමතක නොකෙළෙමු. එදින, අපගේ ශ්‍රී ලංකා මාතාවට බටහිර ආධිපත්‍යයෙන් නිදහස ලැබී හැත්තෑ වසරක් ගත වන දිනය බව අපි අමතක නොකෙළෙමු.
මේ වන විට නැරඹුම් වේදිකාවල සිටි ජනතාව ක්‍රමක්‍රමයෙන් අඩුවන්නට විය. එක් වේදිකාවකට පැමිණි අප සියලූ දෙනාම ඕස්ට්‍රේලියාවේ ආදී වාසීන්ට පුජනිය ස්ථානයක් වූ උලූරු පර්වතය අබියස සීරුවෙන් සිට අපගේ ජාතික ගීය, "ශ්‍රී ලංකා මාතා.." හඬ නගා කියමින් රට, දැය වෙනුවෙන් අපගේ අභිමානය දැක්වූවෙමු.

හිමිදිරි උදයේ තරමක් අඳුරේ, පර්වතය අබියස සිට ජාතික ගීය ගායනා කළෙමු. ජාතියක් වශයෙන් අපගේ නිවහල් බවේ සංකේතය හඬගා කීමට අවස්ථාවක් ලැබීම, අපට කිසිදිනක අමතක නොවන වැදගත් සිද්ධියකි.

අපගේ වැඩ සටහනේ මීළඟ කාර්යය වුයේ උලූරු පර්වතයේ සිට තවත් කිලෝමීටර් 30 ක් පමණ දුරින් පිහිටි තවත් පර්වත සමුහයක් නැරඹීමයි. උලූරු පර්වතයට වඩා වෙනස් පිහිටීමකින් යුක්ත, මෙම පර්වත සමුහය හඳුන්වනුයේ "කාටා ට්ජුටා" (Kata Tjuta) යන ආදී වාසිකයින් විසින් භාවිත කරන ලද නමින් ය. මෙහි විශේෂත්වයක් වනුයේ බොහෝ දුරට ගෝලාකාර එකිනෙකින් වෙන්වූ පර්වත ශිඛර සමුහයක් වන මේවා තනි පර්වතයක් වන උලූරු වලට වඩා වෙනස් ස්වරූපයක් දැරීමයි. මෙම පර්වත සමුහයද ආදි වාසීන් විසින් පූජනියත්වයේ ලා සලකණු ලැබේ.

එදින සවස් වරුවේ ආදී වාසිකයින්ගේ ඔවුනටම ආවේනික සංගීත භාණ්ඩයක් වාදනය කිරීම නැරඹීමට අපට අවස්ථාව සැලසිණ. යිඩාකි (Yidaki) යන නමින් දැක්වෙන ඉතාමත් දිග නලාවක් වැනි මෙම සංගීත භාණ්ඩය මගින් නිපදවෙන නාද රටා ඩිජෙරි ඩූ (Didgeridoo) යන නමින් හැඳින්වේ. අරටුව සහිත එක්තරා වෘක්ෂයක ලීයක කුහරය හාරා මීටර් එකහමාරක් පමණ දිගට සකස් කර ඇති මෙම සංගීත භාණ්ඩයේ සිහින් අග්‍රයට දෙතොල් තබා පිඹින්නේ විශාල අග්‍රය බිම තබාගෙනය. අදිවාසිකයින්ගෙන් පැවත එන ශිල්පියෙකු ඩිජෙරි ඩූ (Didgeridoo) නලාවක් පිඹීම මගින් නිර්මාණය කරන ලද, විශ්මය ජනක සංගීත රටා කෙරෙහි අප කාගේත් සිත් ඇදී ගියේය.

යිඩාකි නලා වාදනය සඳහා පහත ඇඳියට (link) යොමු වන්න.
https•$$www'facebook'com$100009434498321$videos$1999116433746154$@t}35

මෙම නලාවේ ස්වර රටා මැවීම, ශ්‍රී ලංකාවේ අපට හුරු, සක් පිඹීමේදී, වාදනය කරන්නාගේ ස්වරාලය පමණක් භාවිත කර පිටකරන ශබ්දය මගින් සංගීත රටා බිහිකරන ආකාරයට බොහෝ දුරට සමාන බව පෙනේ.



මාර්ගෝපදේශකවරයා මූලික හැඳින්වීමක් කළේය



හිමිදිරි උදයේ තරමක් අඳුරේ, පර්වතය අබියස සිට ජාතික ගීය ගායනා කළෙමු.

සංචාරක නිකේතනයේ ගතකළ අවසාන දිනය අපට ඉතාමත් කාර්ය බහුල දිනයක් විය. උලූරු පර්වතය පාමුල සකස්කර තිබෙන සොබා මං පෙත (Nature Trail) ඔස්සේ ගමන් කර, අදාළ ඓතිහාසික තොරතුරු, ආදී වාසි ජන ජීවිතය පිලිබඳ සැඟවුණු රහස්, අවට පරිසරයේ ජෛව විවිධත්වය, සරක්ෂණ කටයුතු ආදිය විමසා බැලීම යෙදී තිබුණේ එදිනටය. කලින් පිළියෙළ කර ගත් පරිදි තොරතුරු විස්තර කර දීම සඳහා මාර්ගෝපදේශකයෙකුගේ පැමිණීම බලාපොරොත්තුවෙන්, අපි එදින උදේ අටට කලින් පර්වතය පාමුල නියමිත ස්ථානයට රැස් වූයෙමු.
හරියටම පෙරවරු අටට පරිසරයට ගැලපෙන නිල ඇඳුමකින් සැරසුණු, හොඳින් ඉංග්‍රීසි උච්චාරණය කරන ප්‍රිය මනාප පුද්ගලයෙකු අප සිටි තැනට පැමිණියේය. තමා එම සංරක්ෂිත වන අරණේ පාලන අධ්‍යක්ෂක වරයා බවත්, එදින අප වෙනුවෙන් උපදේශන කටයුතු කිරීම ඉතාමත් සතුටෙන් භාරගත් බවත් ඔහු ප්‍රකාශ කළේය. කරුණු පැහැදිලි කර දීම සඳහා ආදී වාසික මාර්ගෝපදේශකයෙකුම පැමිණෙනු ඇතැයි අපි සිතුවෙමු. අපගේ සැකය දුරු කරමින් ඔහු මෙසේ ප්‍රකාශ කළේය

"මට කාල වර්ණ සිරුරක් නොතිබුණාත්, මා ද ආදී වාසි පෙළපතකින් පැවත එන කෙනෙක්. සමහරවිට මාගේ මි මුත්තෙකු හෝ එවැනි පැරැන්ණෙකු යුරෝපීය සම්භවයක් ඇති කාන්තාවක විවාහ කර ගන්නට ඇති. ඒ නිසා පරම්පරා පහකට හයකට පසු මටද සුදු හම සඳහා අවශ්‍ය ජාන ලැබෙන්නට ඇති. ඒ නිසා වෙන්නට ඇති, මට ආදී වාසිකයින්ට ආවේණික දුඹුරු හෝ කාල වර්ණ ශරීර පැහැයක් නැත්තේ" යයි සිනහ මුසු මුහුණින් අපට පවසා තවත් වැදගත් කරුණක් අපට පැහැදිලි කර දුන්නේ මෙසේය.

"මම මගේ ආදි වාසික පෙළපත ගැන ඉතාමත් ආඩම්බර වෙනවා. ඒ නිසාම මම මේ රැකියාව තෝරා ගත්තා. මම ආදී වාසී ජනතාවගේ අයිතිවාසිකම් සහ සංස්කෘතිය රැක ගැනීම සඳහා දිවි හිමියෙන් ඇප කැපවී කටයුතු කරනවා"

ඔහුගේ ජාති මාමක බවත් ප්‍රොඪත්වය ගැනත් අපි බෙහෙවින් සතුටට පත්වීමු.

ආදී වාසීන්ගේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අයට ඕස්ට්‍රේලියානු රජය මගින් එම කාර්යයට අදාළ උසස් අධ්‍යාපනයක් ලබාදී, සෑම පහසුකමක්ම හිමිකරදෙන බවද ඔහු තව දුරටත් අනාවරණය කළේය.
ඔහු ඊට පසු, උලූරු පර්වතය පිලිබඳ සුළු විස්තරයක් කර, එය වටා ඇති සොබා මංපෙත් පිළිබඳවද හැඳින්වීමක් කළේය. මෙයින් පසු, ඔහු විසින් අපගේ පහසුව අඳහා කිලෝමීටර් දෙකකින් පමණ යුක්ත Mala Walk නම් සොබා මං පෙත අපගේ නිරීක්ෂණ චාරිකාව සඳහා තෝරා ගත්තේය.

මිට අමතරව, පර්වතය වටා යාමට හෝ පරවතයේ සුවිශේෂී ස්ථාන නැරඹීම සඳහා සකස්කළ, විවිධ දුර සහිත වෙනත් මං පෙත්ද තිබේ. කිලෝමීටර් 10.6 ක් දිග මංපෙත මෙහි ඇති දිගම මං පෙතයි. පර්වතය වටාම දිවෙන එම මංපෙතෙහි ගමන් කිරීම සඳහා පැය තුනහමාරක් පමණ ගතවේ.

අපට හඳුන්වා දීම සඳහා තෝරා ගත් 'Mala Walk' සොබා මංපෙත, පර්වතයේ බටහිර පැත්තෙන් පිහිටි ඓතිහාසික වැදගත් කම් වලින් පිරි, එමෙන්ම ජෛව විවිධත්වයෙන්ද පරිපූර්ණ ප්‍රදේශයකි.

Mala Walk මං පෙත කිලොමීටර් 2 ක් පමණ දුරකින් යුක්ත වන අතර එය පර්වත පාමුලට ආසන්නවම සකස් කර තිබෙන නිසා පර්වතයේ සුවිශේෂී ලක්ෂණ රාශියක් පහසුවෙන්ම දැක බලා ගත හැකි විය. මෙම මං පෙතට Mala Walk යන නම යොදා ඇත්තේ දිගු කලකට පෙර මෙම ප්‍රදේශයේ ජීවත්වී ඇති මාලා නම් ආදිවාසි මිනිස් කොට්ඨාශයක් සිහිවීම පිණිසය. එසේම මාලා යන නමින් හැඳින්වූ මිනිස් වාසස්ථාන වලට සමීපව ජීවත්වූ, කුඩා වොලබි සත්ත්ව විශේෂයක්ද මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් සිට මෑත කාලයේදී වඳවී යාමේ තර්ජනයට මුහුණ පා සිටින බවද දැනගන්නට ලැබිණ.

මුලින්ම මෙම ප්‍රදේශයේ අතීත කතාව සැකෙවින් විස්තර කරදුන් උපදේශකවරයා, ශතවර්ෂ කිහිපයකට ඉහතදී බටහිර සංක්‍රමණය නිසා ආදිවාසි ජන ජීවිතය අඩාළ වී ගිය ආකාරය පැහැදිලි කළේය.
ඔහු මෙය හැඳින්වුයේ නව තාක්ෂණය නිසා සිදුවූ සංස්කෘතික සෝදා පාළුවකි ලෙසටය. පර්වතයේ, පූජණීයත්වයේ ලා සලකා ඇති සමහර ස්ථාන ඡායාරූප ගත කිරීමද තහනම් බව ඔහුගෙන් දැනගන්නට ලැබිණ.

**Mala Walk මං පෙත කිලොමීටර් 2 ක් පමණ දුරකින් යුක්ත වන අතර එය පර්වත පාමුලට ආසන්නවම සකස් කර තිබෙන නිසා පර්වතයේ සුවිශේෂී ලක්ෂණ රාශියක් පහසුවෙන්ම දැක බලා ගත හැකි විය. මෙම මං පෙතට Mala Walk යන නම යොදා ඇත්තේ දිගු කලකට පෙර මෙම ප්‍රදේශයේ ජීවත්වී ඇති මාලා නම් ආදිවාසි මිනිස් කොට්ඨාශයක් සිහිවීම පිණිසය.**

**ඉතිරි කොටස ළබන මාසයේ**